Kāvyaprakāṣa, Ed, Ragunath Damodar, Oriental Research poone,1950
Sanskrita kāvya vicāra müla dharma,Vijayawardhana Hemapala, Gunasena press, Colcmbo, 1967
Kāvya vicāra gaveṣaṇa,Vijayawardhana Hemapala,
Kāvya rasaya ha bhāṇāva, Rev. D. Piyathissa, Mathara publication, 1950
Siyabaslakara vistara varṇaṇā, Rev. H. Nanasiha, Svabhasa press, Colombo, 1964
Sanskrita kāvya sāhitya, J.thilakasiri, S. Godage Press, Colombo, 1961

# කේ. ජයතිලකගේ චරිත තුනක් නවකතාවේ චරිත නිරූපණය පිළිබඳ විග්‍රහයක්

කුසුම් හේරත්

The novel **Charitha Thunak** by K. Jayathilaka presents characters formed by traditional rural society and culture. The conduct of three main characters of this novel is reviewed herc. These three characters are different in their thinking, aspirations and conduct. The charecter of Isa arises as a main character while Sana is a self-willed characters. Although 'Ranjith' is a teacher by profession he acts selfishly.

නවකථාව වූ කලී ඒ ඒ රටට, ඒ ඒ සාහිත්‍යාංගයට හා ඒ ඒ ලේඛකයාට මෙන් ම ඒ ඒ කෘතියට සුවිශේෂ වූ නවතම ලක්ෂණවලින් යුක්ත කලා මාධ්‍යයකි. ඉයන් වොට් නම් විචාරකයාගේ අදහස අනුව ද නවකථාව වූ කලී නවතාව විෂයයෙහි පෙර නොවූ විරූ අවධානයක් යොමු කෙරෙන සාහිත්‍යාංගයකි.[1] නවකථාව නම් සාහිත්‍යාංගය පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් වී ඇති මත අසම්පූර්ණ බව ඒ ඒ විචාරකයන් විසින් ම පිළිගනු ලැබ ඇත.[2] එයට හේතු ව මෙම සාහිත්‍යාංගය සෙසු සාහිත්‍යාංගවලට වඩා සංකීර්ණ ලක්ෂණවලින් යුක්ත වීමයි.

නවකථාවේ ස්වභාවය එබඳු වුව ද නවකථාව නම් සාහිත්‍යාංගය විමසීමේ දී එහි සන්දර්භය, කථා වින්‍යාසය, චරිත නිරූපණය, දෘෂ්ටිකෝණය ආදී ශිල්පීය ලක්ෂණ පමණක් නොව, එම කෘතිය මගින් යථාර්ථ නිරූපණ ඇසුරෙන් ජීවිතය කෙරෙහි හෙළන ආකල්පය ද ඇතුළු කරුණු රැසක් කෙරෙහි අවධානය යොමු විය යුතු ය. නවකථාකරුවාගේ පරමාර්ථය වන්නේ ස්වකීය නිර්මාණය

© ආචාර්ය කුසුම් හේරත්
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

මගින් පාඨකයා තුළ ප්‍රබල මෙන් ම අර්ථවත් වින්දනයක් ජනිත කිරීම වුව ද ඒ මගින් අනාවරණය කෙරෙන දෘෂ්ටිය ප්‍රබල විය යුතු ය. ඒ සඳහා වටිනා ම සාධකය බවට පත්වන්නේ අදාළ කෘතියේ චරිතයි. නවකථාවේ අන් සියලු අංගවලට වඩා චරිත නිරූපණය ඉස්මතු වන්නේ එහෙයිනි. නවකථාකරුවා චරිත නිරූපණය කරන්නේ එක් එක් චරිතය වෙන් වෙන් ව සලකා ගෙන නොවේ. ඔහුගේ කාර්යය වනාහි කථාවේ එන සියලු චරිත ඔවුනොවුන් හා එකට සම්බන්ධ වන හා ගැටෙන බව සලකා ඒ ප්‍රධාන අප්‍රධාන හැම චරිතයක ම ක්‍රියාකාරිත්වය එකට විදහා දැක්වීම ය[3] යනුවෙන් සඳහන් කෙරෙන්නේ ද එහෙයිනි. හොඳ නවකථාවක පදනම නම් චරිත නිරූපණය මිස අනෙකක් නොවේ. කථා ශෛලිය වැදගත් ය. කථා වින්‍යාසය වැදගත් ය. ලේඛකයා දරන ආකල්පයන්ගේ නවතාව වැදගත් ය. එහෙත් මේ එකක්වත් චරිතයන්ගේ විශ්වසනීයත්වය තරම් වැදගත් නොවන්නේ ය[4] යනුවෙන් සඳහන් අදහස අනුව චරිත නිරූපණය මෙන් ම චරිතවල විශ්වසනීයත්වය ද වැදගත් ය. එසේ ම නවකථාකරුවාගේ උත්සාහය විය යුත්තේ අපූර්ව චරිත අපූර්ත්වයකින් යුතු ව ඉදිරිපත් කිරීමයි. ස්වකීය කථාවෙන් පෙර නොවූ විරූ චරිතයක් හෝ චරිත කීපයක් ඉදිරිපත් නොවුවහොත් එය නවකථාවක් නොවන්නේ ය.[5] නවකථාවේ නවතාව ආරක්‍ෂා වන්නේ ඒ මගින් නිරූපණය කෙරෙන අපූර්ව වූ චරිත පදනම් කොට ගෙන ය. යථාර්ථ නවකථාවේ සාර්ථකත්වය ඇති වනුයේ පෞද්ගලික (Individual) වූ ද පොදු හෙවත් සමාජ සාධාරණ (Typical) වූ ද ගති ලක්‍ෂණයන්ගෙන් යුක්ත චරිත මගිනි.[6] ඒ අනුව සෑම නවකථාවක ම පාහේ අන්තර්ගත චරිතයන්හි පෞද්ගලික ලක්‍ෂණ මෙන් ම පොදු ලක්‍ෂණ ද අන්තර්ගත වේ.

මෙහි දී අප අවධානය යොමු කරන්නේ **චරිත තුනක්** නවකථාවේ චරිත නිරූපණය පිළිබඳ ව ය. ප්‍රකට නවකථාකරුවකු වූ කේ. ජයතිලකගේ **චරිත තුනක්** නවකථාව 1963 දී නිර්මාණය වූවකි. එම නවකථාව රචනා වී ඇත්තේ අවුරුදු සියයකට පමණ ඉහත බස්නාහිර පළාතේ පිටිසර ගමක් පසුබිම් කර ගෙන ය. එම ගමෙහි වූ භෞතික පරිසරයත්, සමාජ සංස්කෘතික ලක්‍ෂණත්, ගම්වැසියන්ගේ ජීවිත ස්වභාවයත් සියුම් ව නිරීක්‍ෂණය කොට දැක්වීම කෘතිය මගින් සිදුවෙයි. ගැමි යැයි සඳහන් කළ හැකි ආකාරයේ චරිත කීපයක් වටා



මෙම කථාව ගොඩනැඟී තිබීම ද විශේෂත්වයකි. තවද හේන් ගොවිතැන හා වී ගොවිතැන ජීවන වෘත්තිය කර ගත් මේ මිනිසුන්ගේ ජීවිතවල පැවති යථා ස්වභාවය හා ඔවුන් ඒ කටුකත්වයෙහි එල්බ කල් ගෙවූ ආකාරය මෙන් ම ඔවුන්ගේ සිරිත් විරිත්, ගැමි පරිසරය වර්ණනා කරන්නට වැඩි ඉඩකඩක් වෙන් වී තිබීම ද වැදගත් ය.

ගොවියා අවුරුද්දේ එක්තරා කාල සීමාවක කුඹුරු හා බිම් සකස් කොට වී වපුරයි. අනතුරු ව ගොයම් පීදී පැසී ගිය කල අස්වැන්න කපා පාගා එකතු කර ගන්නා අතර අනතුරු ව විවේකයෙන් කාලය ගත කරයි. ඉතා සරල දිවි පෙවෙතක් ගොවියාට හිමි ය. ඔවුහු අල්පේච්ඡ ජීවිත ගත කරති. එසේ වුව ද මනුෂ්‍යයාට පොදු වූ විවිධ හැල හැප්පීම්, දුක්ඛ දෝමනස්සයන් ඔවුන්ට ද උරුම ය. ගැටුම් ද පවතී. මෙම නවකථාව ගොඩනැඟී ඇත්තේ පිටිසර ගමක ජීවත් වූ එක්තරා පවුලක් පසුබිම් කර ගෙන ය. ගැමි පවුල නමැති කුඩා ඒකකයේ කක්‍ෂය ඉතා කුඩා බැවින් ඔවුන් අතර ඇති බැඳීම ද ඉතා ශක්තිමත් ය. එම බැඳීම දෙදරා ගිය කළ ඇති වන මානසික පීඩනය සුළුපටු නොවේ. විපතේ දී ඔවුහු මහත් සේ පීඩාවට හා වැළපීමට පෙළඹෙති. මෙම නවකථාවෙහි දුක සැප දෙකෙහි දෝලනය වන මේ මිනිසුන්ගේ ජීවිත අන්දරය අන්තර්ගත ය.

**චරිත තුනක්** නවකථාවේ විෂමතා බහුල චරිත තුනක් හා ඔවුන් වටා ගොඩනැගුණු අවශේෂ චරිත කීපයකින් සමන්විත ය. මෙහි කථානායකයා උගත්කම් සහිත කෙනෙකු නොවේ. ඔහු දුබල මෝඩයෙකු ද නොවේ. ආත්මකථනය සඳහා ගැමියෙකු වූ ඔහුගේ මුවට නැංවෙන බස කථාපුවත හා මැනවින් බද්ධ ව ඇත. නවකථාවේ දී කර්තෘ උපයෝගී කරගන්නා චරිත ක්‍රියා කරන්නේ එම චරිතවල ස්වභාවය පදනම් කර ගෙන ය. ඔවුන් හැසිරෙන්නේ නවකථාව ගොඩනඟා ඇති පරිසරය සමග ය. **චරිත තුනක්** නවකථාවේ ප්‍රධාන යැයි පෙනෙන චරිත තුන ම පැන නඟින්නේ එක ම මූලයකිනි. ඒ අවස්ථාවේ පටන් ම ඔවුහු එකිනෙකා කෙරෙන් විවිධතා ප්‍රදර්ශනය කෙරෙති. ඔවුන් හැදී වැඩී වැඩිහිටියන් බවට පත්වන්නේ ද එක ම පරිසරයක ය.

> ''... කේ. ජයතිලකගේ නවකථාවේ රටේ බටහිරකරණය වූ අර්ධ නාගරික ප්‍රදේශයෙන් එතරම් දුරස් නොවූ ප්‍රදේශයක් පසුබිම් කර ගෙන ඇති අතර ඔවුන්ගේ ම පෞද්ගලිකත්වයක් සහිත චරිත ඉදිරිපත් වෙයි. ඒවා දෙවර්ගයකි. එක් වර්ගයක් සාම්ප්‍රදායික සාරධර්ම අනුව ගිය ඒවා ය. අනික් වර්ගය තනි පුද්ගල චරිත ය. මේ ගැටුම තුළින් ඉස්මතු වනුයේ නවකථාවේ කථකයා වූ ඉසාගේ චරිතයයි. ඔහු වරින්වර ඇති වන පසුතැවිලි මධ්‍යයේ වුවත් තමන්ගේ පෞද්ගලික සංතුට්ටිය අනුන්ගේ යහපත වෙනුවෙන් කැප කළ අයෙකි...''[7]

යන විචාරයෙන් ද නවකථාවේ චරිත පිළිබඳ අවබෝධයක් ලද හැකි ය. තවද,

> ''... කවරක වුව ද අර්ථවත් බව ඇති වන්නේ නවකථාකරු සෙසු චරිත සමග තුලනාත්මක ව ඒවා විග්‍රහ කරන ආකාරයෙනි. කොතරම් විශේෂ චරිතයක් වුවත් සමාජයෙහි දුරස්ථ ව සිටින තාක් එය එය හුදු චරිතයක් පමණකි. එහි අර්ථපූර්ණත්වය ඉස්මතු වී පෙනෙන්නේ එය සමාජයත් සමග ඇලුම්, බැඳුම්, ගැටුම් ඇති කර ගන්නා විට ය...''[8]

යන ප්‍රකාශයෙන් ද නවකථාවේ චරිත නිරූපණයෙහි වැදගත්කම පැහැදිලි වේ.

මෙම නවකථාවේ ප්‍රධාන චරිතය වන ඉසා කුඩා අවධියේ පටන් ම විවිධ සිතුම් පැතුම් සහිත ව ක්‍රියා කරයි. එම අදහස් ළමා වියට ආවේණික වුව ද වෙනත් ගැමි දරුවන්ට වඩා තම නිවස, වටපිටාව, ආර්ථික තත්ත්වයන් ආදිය කෙරෙහි ඔහු සවිඥානක වෙයි. ළමා වියේ සිට වැඩිහිටියෙක් බවට පත්වන තෙක් ම ඔහුගේ චරිතය විකාශනය වෙන බැවින් මුළු ජීවිත කාලය තුළ ම ඒ ලක්ෂණ වර්ධනය වන අයුරු පාඨකයාට මැනවින් නිරීක්ෂණය කළ හැකි ය. ඔහුගේ සිතුම් පැතුම්වලට මෙන් ම අපේක්ෂාවන්ට ද සෑම අතින් ම පහර වදින බවක් පෙනෙයි. කුඩා අවධියේ සිට ම පියා ඔහුගේ ක්‍රියාකලාපය අනුමත නොකරන්නේ ය. සෑම විට ම දෙමහල්ලන්ග් දෝෂදර්ශනයට ලක් වන්නේ ද ඔහු ය. ඒ බව කෘතියේ මුල් කොටසින් මනා ව පැහැදිලි වෙයි. සම වයසේ වෙනත් ගැමි දරුවන් හා සසඳමින් ඔහු ඉදිරියේ ම ඔහු විවේචනය කිරීමට දෙමව්පියෝ පෙළඹෙති. එවන් අවස්ථාවල ඔහුගේ මනස ආත්මානුකම්පාවෙන්



තෙත් වුව ද ඒ සියල්ල යටපත් කොට සිය අපේක්ෂා මුදුන්පමුණුවා ගැනීමට ඔහු යත්න දරන්නේ ය. උත්සාහවන්ත අධිෂ්ඨානශීලී ගති පැවතුම් ඉසා කෙරෙහි විද්‍යමාන ය. අවශ්‍යතාව මත පරාජය ඉක්මනින් අමතක කර දැමීමට එම පරිසරය විසින් ම ඔහු පොළඹවයි. ඔහුගේ ආත්ම විශ්වාසය බලවත් ය. එක් බාධාවකින් පසුබට නොවන ඔහු ගැමි සමාජයට උරුම වෙනත් ලක්ෂණයක් විසින් ජයගනු ලබයි.

''... මම යන්ට ඕනෑ අර වෙලේ කඬාඬුව බඳින්ට...''[9] යනුවෙන් ඔහුගේ මුල් ම උත්සාහය පිළිබඳ ව මවට සඳහන් කරන විට ඇය එය ගණනකට නොගන්නී ය. ඔහු එවැනි අවස්ථාවල සිය අරමුණ යටපත් කර නොගනී. ගැමි පරිසරයට ආවේණික ලක්ෂණයක් ලෙස අනුන් පිළිබඳ සිතීම හෙවත් යුතුකම් පිළිබඳ හැඟීම ද ඉසා කෙරෙහි දැකිය හැකි ය. මෙය ගැමි පරිසරය දීර්ඝකාලීන ව අදෘශ්‍යමාන ව පිවිස පවතින්නකි. සංස්කෘතියක හැඩගැස්මේ ඇති විශේෂත්වය මෙයයි. එනම් නොපෙනෙන ආකාරයකින් මිනිස් චරිත හැඩගස්වාලීමයි.[10] ඉසා මුල දී හිරිමල් තරුණ වියට පා තබනවාත් සමග බොළඳ සිතුම් පැතුම් අභ්‍යන්තරයට පිවිසිය ද ඒවායෙන් උමතු වූවෙකු ලෙස ක්‍රියා නොකරයි. ඒ වෙනුවට තමා කුමක් හෝ කළ යුතුය යන අධිෂ්ඨානය සහිත වෙයි. කෝකිලාන කැපීම එවැනි ඔහු කෙරෙහි වූ අරමුණකි. ඔහු කෙසේ හෝ ඒ අරමුණ සාක්ෂාත් කර ගනියි. ළමා වියේ සිට සිතේ තැන්පත් වන සිතිවිලි වයසින් මුහුකුරා යත් ම ඉෂ්ටසිද්ධ වන බව මේ මගින් අනාවරණය කර ගත හැකි ය.

ඉසාගේ වයස්ගත ජීවිතයේ යුතුකම් පිළිබඳ සිතිවිලි මුහුකුරා යන්නට පටන් ගනියි. මව වෙනුවෙන් මෙන් ම රංජිත් වෙනුවෙන් පීතෘ සෙනෙහසින් ක්‍රියාත්මක වීමට ඔහුට හැකියාව ලැබෙන්නේ ගැමි සංස්කෘතියෙහි ලියලා වැඩෙන මානව ධර්මතා නිසා ය. තම අරමුණ වෙනුවට අපේ යන සංකල්පය ඉස්මතු වන පරිදි ක්‍රියා කිරීමට ඉසා පොළඹවාලන්නේ ආකස්මික ව නොවේ. ඔහු හැදුණු වැඩුණු පරිසරයෙනි. කෙසේ වුව ද ඔහු පෘථග්ජනභාවය ඉක්මවා යන්නේ ද නොවේ. ජීවතයේ නොයෙක් අවස්ථාවල දී මනුෂ්‍යත්වයට පොදු වූ දුර්වලතා ඔහු කෙරෙහි ඉස්මතු වී ක්‍රියාත්මක වන අයුරු අපට නිරීක්ෂණය කළ හැකි ය. රංජිත්ට මිල මුදල් දෙන අවස්ථාවල දී මෙන් ම මවට උපසත්කාර, සැලකිලි කරන අතර යම් යම් මානසික

දුර්වලතා ඇති කර ගන්නේ එහි ප්‍රතිඵලයක් හැටියට ය. එහෙත් ඔහු කථාව අවසානය වන විට බොහෝ දේ අවබෝධ කර ගත් මධ්‍යස්ථ මනුෂ්‍යයකුගේ තත්ත්වයට පත්වෙයි. පසුතැවිල්ල, පාළුව, තනිකම වියපත් මිනිසා තුළ නිරායාසයෙන් ම වර්ධනය කෙරෙන සිතිවිලි ය. ඔහු ද එවැනි සිතිවිලිවලට යටත් වුව ද අපේක්ෂා භංගත්වයට පත් ව ඔත්පල වූ අයෙකු වශයෙන් ඔහු නිරූපණය නොවේ.

එහෙත් පොත අගට යෙදෙන සනාගේ උදානය කියවීමෙන් ඔහුගේ චරිතය පිළිබඳ පාඨක සිතෙහි සංවේගයක් උපදී.

> ''... මේ හැරෙන්නට මුළු කෝකිලානම දැන් එකම පාළු පෙතකි. කොස්, පොල් වැනි ලොකු ගස් හා ඉබේ වැවුණු වල් පැලැටි හැරුණු විට මා විසින් සිටුවන ලද එළවළු කොටු කිසිවක් එහි නැත. එළවලු පාත්ති තිබූ තැන්වල අගල් ගොඩ වී ඒවා තණකොළ වැඩුණු කාණු බවට පත් වී ඇත. ගස්වල හැදෙන කොස්, දෙල්, අඹ, රඹුටන් ආදිය සනා, රංජිත් හෝ වෙනත් ගැමියෝ කඩා ගෙන යති. ඒවා ගැන රණ්ඩු කිරීමට සනා හෝ රංජිත් ඉදිරිපත් වූ හැම විට ම මම ඔවුන් වළක්වා ලූයෙමි...''[10]

සනාගේ චරිතය කෙරෙහි බලපවත්වන්නේ අනුකූලතා දක්විය නොහැකි දුර්වල අංශයකි. ඔහු යම් තරමකට මර්දනය කෙරෙන්නේ වැඩිමහල් සොයුරු ඉසා විසිනි. ගැමි සමාජයට ආවේණික වූ දරුවන්ට දැඩි ලෙන්ගතුකමක් දක්වීම ස්වභාවය චරිත තුනෙහි නිරූපණය වන දෙමාපියන් තුළ ද දැකිය හැකි ය. දෙමව්පියන් විසින් එක්තරා දුරකට හුරතල් කරනු ලබන සනා ඒ නිසා ම හිතුවක්කාරයෙකු බවට පත්වෙයි. ඔහුගේ ක්‍රියාකලාපය මර්දනය කිරීමට යම් බලපෑමක් කළ හැකි වූ පියාගේ මරණයෙන් පසු ඒ තත්ත්වය උග්‍ර වෙයි. මිනිසා ජයග්‍රහණය ලබන්නේ යම් අංශයකින් ද ඔහු ඒ අංශයෙන් ඉදිරියට ම යයි. සනා නිතර ම ජය ලැබුවේ අනුන්ට හිරිහැර පීඩා කිරීමෙනි. ඔහු කොතරම් හිතුවක්කාර වුව ද සිතෙහි පැලපදියන් ව කැකෑරෙන සිතිවිලි නොවී ය. කිසිවක් දුරදිග බලා කටයුතු කිරීම ඔහුගේ සිරිත නොවේ. ආවේග බහුල ය. බුද්ධියට වඩා හදවතට ඉඩ සැලසීම සනාගේ ස්වභාවයයි. ඔහුගේ නොකටයුතුකම් අනුන්ට විවිධ පීඩා ඇති කළ ද සනාගේ චරිතය කුහක ගුණමකුවෙකුගේ තත්ත්වයෙන් නිරූපණය නොවේ. ඔහු



නොහැකියාවෙන් යුත් ජීවිතය තේරුම් නොගත් අමනයකු ලෙස හැසිරුන ද ජීවිතයේ අවසන් භාගයේ දී මවගේ අවධානයට වැඩි වශයෙන් ඉලක්ක වූයේ සනා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් ය. මෙය ගැමි පරිසරයේ දැකිය හැකි සුලබ ලක්ෂණයකි. හැකියාව හා වත්කම් ඇති තැනැත්තා කෙරෙහි නොව නොහැකි - දිළිඳු දරුවාගේ පවුල වෙත මනසින් සමීප වීම දෙමාපියන්ගේ ස්වභාවයයි. ඒ අතින් සනා චරිත තුනක්හි පවුලේ හිතහොඳ හිතුවක්කාරයෙකු සේ නිරූපිත ය. ඉසා තනි වූ විට ඔහුට යම් යම් අවස්ථාවල දී සමීප වීමට ඔහු පෙලඹෙන්නේ ලාභ සත්කාර අපේක්ෂාවෙන් ම යැයි සිතිය නොහැකි ය. ගැමි පරිසරයේ බොහෝ දුරට නොහොඳ නෝක්කාඩු ඉතා කෙටි කාලයකට සීමා වන බැවිනි.

රංජිත්ගේ චරිතය විකාශනය වන්නේ සියල්ලන්ගේ සැලකිල්ලට භාජනය වන වාසනාවන්තයෙකු ලෙසිනි. ඔහු ස්වකීය වූ පෞරුෂයකින් යුක්ත වූවෙකු නොවේ. එක් අතකින් දෙමව්පියන්ටත් ඒ හා සමාන ව ම වැඩිමහල් සහෝදරයාටත් කීකරු ව වැඩ කිරීමට ඔහුට සිදුවෙයි. ඇතැම් අවස්ථාවල දී සනාගේ අකටයුතුකම් වුව ද ඉවසීමට ඔහුට සිදු වන්නේ ය. නිහඬ ගති පැවතුම්වලින් යුක්ත ව තමා වෙතට නැඹුරු වූ සිතුම් පැතුම් හේතුවෙන් මුල දී ඔහු කිසිවකුගේ සතුරෙකු බවට පත් නොවී ය. පියාගේ මරණයෙන් වුව ද දැඩි පසුබෑමකට ලක් නොවන රංජිත් කෙරෙහි පීතෘභාවයෙන් කටයුතු කරන්නේ ඉසා ය. රැකියාව වශයෙන් ගුරු වෘත්තියට පිවිසෙන ඔහු දැඩි ආත්මාර්ථකාමී චරිතයක් බවට පත් වන්නේ ය. දැඩි මසුරුකමින් ද යුතු වූ ඔහු බැහැරට විහිද ගිය චරිතයක් නොවී ය. විවාහයෙන් පසු පවා ප්‍රදර්ශනය වූයේ එම ගති ලක්ෂණයන් ය. ඔහුගේ අධ්‍යාපනය පන්සල් හෝ පිරිවෙන් මුල් කර ගත් සාරධර්ම සහිත අධ්‍යාපන ක්‍රමයක් නොව බහුවිධ වර්තමාන අධ්‍යාපන රටාවෙහි වූ තරඟකාරී පක්ෂයෙහි ආරම්භක ලක්ෂණ අනාවරණය කළ විභාග ඉලක්ක කර ගත් අධ්‍යාපන ක්‍රමයයි. ඒ මගින් ඔහු දැඩි ආත්මාර්ථය උදෙසා ම ක්‍රියා කරන්නෙකු බවට පත්වෙයි. ගුරුවරයෙකු වුව ද සාම්ප්‍රදායික, වෘත්තියට කැප වූ ගුරුවරයෙකු බවට පත්වීමට රංජිත්ට හැකි නොවෙයි. මුදලට මුල්තැන ලබා දෙන වෘත්තිකයෙකුගේ තත්ත්වයෙන් ඔහු නිරූපණය වේ. එයට හේතුව කෘතියේ කිසිදු තැනක ඔහුගේ වෘත්තීය ජීවිතයෙහි බිඳක් හෝ අනාවරණය නොවීමයි. ''... ජීවනෝපායත් සමග සේවය

සම්මිශ්‍රණය කිරීමෙන් එය පිහිටුවා ගැනීම තවම ආරම්භ වී නොතිබිණ. එවැන්නක පුරෝගාමියා වීමේ ශක්තිය ද ඔහු වෙත නොවී ය...''[11] යනුවෙන් කතුවරයා පසුවදනෙහි දක්වන්නේ එබැවිනි. අන් අයගේ උපකාරයෙන් ඉදිරියට එන ඔහුගේ ජීවිතය දියාරු ස්වභාවයෙන් යුක්ත වෙයි. වෘත්තීය ජීවිතයේ දී මෙන් ම පෞද්ගලික ජීවිතයේ දී ද මෙම ලක්‍ෂණ ප්‍රදර්ශනය වෙයි. සහෝදරයෙකු වෙනුවෙන් කැපවීම හෝ යුතුකම් ඉටු කිරීම ඔහුගෙන් සිදු නොවෙයි. අන් අයගේ උපකාර ලබා ගන්නවා විනා අන් අයට උපකාර කිරීම - කළගුණ සැලකීම ඔහු අවබෝධ කර ගෙන නොමැති බව කෘතිය පුරා ම ප්‍රදර්ශනය වේ. තමා ආදරයෙන් හදාවඩා ගත් මව රෝගාතුර ව දුර්වල වූ අවස්ථාවේ දී පවා ඔහු ක්‍රියා කරන්නේ ආත්මාර්ථකාමී තැනැත්තෙකු පරිදි ය.

එසේ ම ඔහු කිසිවකට හෝ ඔරොත්තු දෙන ශක්තිමත් චරිතයක් ලෙස නිරූපණය නොවේ. සැඟවුණු ගති ස්වභාවය ඔහු කෙරෙහි විද්‍යමාන ය. ඒ බව ජීවිතයේ විවිධ හැලහැප්පීම් ඉදිරියේ ඔහු ක්‍රියා කළ ආකාරයෙන් පැහැදිලි වේ.

> ''... රංජිත් කෑම ටික කන්නේත් ශෝකයෙන් මුහුණ
> බර කර ගෙන හතර වටින් කරදරවලින් තෙරපෙන්නාක්
> මෙන් කල්පනා කරමින් හෙමිහිට ය...''[13]

යන පාඨයෙන් ද ඒ බව පැහැදිලි වේ.

සමස්තයක් වශයෙන් ගත් කල කේ. ජයතිලකගේ **චරිත තුනක්** නවකථාවේ නිරූපණය වන ප්‍රධාන චරිත තුන තෙමඟකට විහිදුනු සිතුම් පැතුම් හා චර්යාවන්ගෙන් සමන්විත වන බව මේ මගින් හඳුනාගත හැකි ය. ගැමි සාරධර්මවලින් යුක්ත ව හැදී වැඩී ක්‍රියාත්මක වීම හේතුවෙන් ඉසා සමාජ සාධාරණ චරිතයක් වශයෙන් නිරූපණය වන අතර දෙමාපියන්ගේ හා වැඩිමහල් සහෝදරයාගේ යම් යම් බලපෑම් හේතුවෙන් රංජිත්ගේ ක්‍රියාකාරකම් ආදියත් සංයමයෙන් යුතු ව ගොඩනැගී ඇති නමුදු සනා තරමක් හිතුවක්කාරයෙකු ලෙස ගොඩනැඟී ඇත. කේ. ජයතිලක තම ජීවිතය හා හැදී වැඩුණු පරිසරය පදනම් කොට ගෙන වැනසී යන සමාජ ආචාරධර්ම, සාම්ප්‍රදායික සිරිත් විරිත් හා ගැමි පරිසරය මැනවින් නිරූපණය කරමින් **චරිත තුනක්** නවකථාව ගොඩනඟා ඇති අතර එහි සාර්ථකත්වය සඳහා



ඉහත සාකච්ඡාවට භාජනය වූ චරිත ත්‍රිත්වයෙහි ආලෝකය මැනවින් පතිත වී ඇති බව පැහැදිලි වේ.

**ආන්තික සටහන්:**

1. සුරවීර, ඒ. වී., (1993) **නවකතා නිර්මාණය හා අවබෝධය**,
2. Ian Watt, (1967) **The Rise of the Noval**, California, 6th Printing, p. 13.
3. **නවකතා නිර්මාණය හා අවබෝධය**, 82 පිටුව.
4. Virginia Woolf,
5. **නවකතා නිර්මාණය හා අවබෝධය**, 83 පිටුව.
6. **වීමංසා**, සං. උදය මල්ලවආරච්චි, (1985) අංක 21, ඒ. වී. සුරවීරගේ සිංහල නවකථාව: සමාජ  චරිත හා පුද්ගල චරිත, 9-16 පිටු.
7. **චරිත තුනක්**, ප්‍රස්ථාවනාව, එදිරිවීර සරච්චන්ද්‍ර, 6 පිටුව.
8. **චරිත තුනක්**, පෙරවදන, 3-4 පිටු.
9. ජයතිලක, කේ., (1963) **චරිත තුනක්**, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ, 21 පිටුව.
10. **චරිත තුනක්**, 160 පිටුව.
11. **චරිත තුනක්**, පසුවදන, 174 පිටුව.
12. **චරිත තුනක්**, පසුවදන, 175 පිටුව.
13. **චරිත තුනක්**, 139 පිටුව.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. ජයතිලක, කේ., (1963) **චරිත තුනක්**, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.
2. **වීමංසා**, සං. උදය මල්ලවආරච්චි, (1985) අංක 21, ඒ. වී. සුරවීරගේ සිංහල නවකථාව: සමාජ චරිත හා පුද්ගල චරිත.
3. Ian Watt, (1967) **The Rise of the Noval**, California, 6th Printing.
4. Virginia Woolf.
5. සුරවීර, ඒ. වී., (1993) **නවකතා නිර්මාණය හා අවබෝධය**, කොළඹ.